LOGS.LK

# විශේෂ නිවේදනයයි

**උපාධිධාරී අභ්‍යාසලාභීන් හා සංවර්ධන නිලධාරීන් වයඹ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2022**

උක්ත බඳවා ගැනීම යටතේ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මාර්ගගත ක්‍රමය මගින් අයදුම්පත් ඉදිරිපත් කළ උපාධිධාරී අභ්‍යාසලාභීන් හා සංවර්ධන නිලධාරීන්සඳහා සුදුසුකම් පරීක්ෂාකිරීමේ සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ 2022.07.10 දිනෙන් පසුව වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණයේදී පැවැත්වීමට කටයුතු සැලසුම් කරමින් පවතී.

මෙම සුදුසුකම් පරීක්ෂාකිරීමේ සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ඒ ඒ අයදුම්කරුවන්ට වෙන් වෙන්ව කැඳවීම් ලිපි එවීමක් සිදු නොකරන අතර කැඳවීම් නිවේදන මෙම වෙබ් අඩවියෙහි පමණක් පළ කරනු ලැබේ. **එබැවින් නිරන්තරයෙන් මෙම වෙබ් අඩවිය පරිශීලනය කරන මෙන් දැනුම් දෙමි.**

බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් ලකුණු ලබා දීමට අදාළ සහතික කිසිවක් සම්මුඛ පරීක්ෂණයෙන් පසුව භාර නොගන්නා බැවින්, අදාළ සියලු සහතික සම්මුඛ පරීක්ෂණයට පැමිණෙනවිට රැගෙන ඒමට කල් වේලාසන සූදානම් කර තබා ගැනීම සුදුසුය.

ඊට අමතරව, බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් ආකාරයට ප්‍රායෝගික පරීක්ෂණයක්ද, සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදීම පැවැත්වෙන බැවින්, ඊට ද කල් වේලාසන සූදානම් වීම සුදුසුය. මෙහිදී පරිගණක හා වෙනත් විද්‍යුත් මාධ්‍ය ආශ්‍රිත ඉදිරිපත් කිරීම් සඳහා පහසුකම් සැපයීමක් සිදු නොකරන බව දන්වන අතර සෑම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකටම White Board සපයනු ලැබේ. අවශ්‍ය White board markers හාඅනෙකුත්ද්‍රව්‍යඅපේක්ෂකයින්විසින්සපයාගතයුතුය.

පහත සඳහන් ලේඛනවල මුල් පිටපත් සහ ඡායා පිටපත් වෙන වෙනම සකස් කරගෙන ඡායා පිටපත්වල"**මුල් පිටපතෙහි සත්‍ය පිටපතක් බවට සහතික කරමි.**"යනුවෙන් ඔබ විසින් ලියා අත්සන් තබා නියමිත දින සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙනවිට රැගෙන ඒමට සූදානම් කර තබා ගන්නා මෙන් ද දන්වමි.

- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත
- උපාධි සහතිකය / ඩිප්ලෝමා සහතිකය **(උපාධිය වලංගු වන දිනය පැහැදිලිව සඳහන් විය යුතුය)**
- උපාධි ප්‍රතිඵලවලට අදාළ විස්තරාත්මක ලේඛනය **(උපාධිය වලංගු වන දිනය පැහැදිලිව සඳහන් විය යුතුය)**
- බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් අමතර ලකුණු ලබා දීමට අදාළ සියලු සහතික
- උපාධිධාරී අභ්‍යාසලාභී බඳවා ගැනීමේ ලිපිය
- පුහුණුව සඳහා වැඩභාරගත් ලිපිය
- සංවර්ධන නිලධාරී ස්ථිර පත්වීම් ලිපිය
- ස්ථිර පත්වීම අනුව වැඩ භාරගත් ලිපිය
- ග්‍රාම නිලධාරී සහතිකය (අයදුම්කරුහට වයඹ පළාත තුළ වසර 03ක ස්ථිර පදිංචිය නොමැති අවස්ථාවල, කලත්‍රයාගේ පදිංචි සහතිකය හා විවාහ සහතිකය අයදුම්කරුගේ පදිංචි සහතිකය සමඟ ඉදිරිපත් කිරීම හෝ අයදුම්කරු වයඹ පළාත

තුළම වෙනත් ග්‍රාම නිලධාරී වසමක පදිංචි වී සිටියේ නම් අදාළ ග්‍රාම නිලධාරී වෙතින් ලබා ගත් ලිපියක් ද ග්‍රාම නිලධාරී සහතිකය සමග ඉදිරිපත් කිරීම මගින් හෝ වසර තුනක පදිංචිය සනාථ කළ හැකිය.)

- වර්තමාන සේවා ස්ථානයෙන් ලබා ගත් සේවා සහතිකය
- සහතිකවල සඳහන් නම්වල වෙනසක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්.

සම්මුඛ පරීක්ෂණය සඳහාපැමිණීමේදී, ඉදිරියේදී මෙම වෙබ් අඩවියේ පළ කිරීමට නියමිත ප්‍රකාශ පත්‍රය ද සම්පූර්ණ කර රැගෙන ආ යුතු බවද සලකන්න.

ටී.බී. වික්‍රමසිංහ,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව